Unilever

258, එම්. වින්සන්ට් පෙරේරා
මාවත
කොළඹ 14
0114700800

# යුනිලිවර් ශ්‍රී ලංකා, නුවරඑළියේ වෛද්‍ය ආයතන සේවා සඳහා දායක වෙමින් සෞඛ්‍ය සේවා අංශයට තව දුරටත් සහයෝගය දක්වයි

## *Ceytea තේ කර්මාන්තශාලාව රුපියල් මිලියන 2ක් වටිනා අත්‍යාවශ්‍ය වෛද්‍ය උපකරණ පරිත්‍යාග කරයි*

**2021, අගෝස්තු 30, කොළඹ** - ආගරපතන පිහිටි යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමට අයත් Ceytea තේ කර්මාන්තශාලාව මඟින් පසුගියදා නුවරඑළිය කලාපයේ වෛද්‍ය සේවා ආයතනයන් වෙත රුපියල් මිලියන 2ක් වටිනා අත්‍යාවශ්‍ය වෛද්‍ය උපකරණ ප්‍රදානය කරන ලදී. එම උපකරණ ප්‍රදානය කරනු ලැබූ ආයතන අතරට මේ වන විටත් පවතින වසංගත තත්වයට එරෙහිව කටයුතු කරමින් සිටින නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහල, ආගරපතන ප්‍රාදේශීය රෝහල, ලිඳුල ප්‍රාදේශීය රෝහල සහ ලිඳුල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය අයත් වේ.

එම වෛද්‍ය ආයතන සියල්ලම ප්‍රදේශයේ දහස් ගණනක ජනතාව වෙත ප්‍රතිකාර කිරීමේ වගකීම දැරුවද ඇතැම් අත්‍යවශ්‍ය රෝග විනිශ්චය තාක්ෂණ සහ එදිනෙදා පුද්ගලික ආරක්ෂක උපකරණ හිඟයක් ඔවුන්ට ඇත. මෙම අවශ්‍යතාව මනාව අවබෝධ කරගත් Ceytea තේ කර්මාන්තශාලාව මඟින් එම රෝහල්වලට අවශ්‍ය පී සීර් ආර් පරීක්ෂණ සඳහා යොදා ගන්නා (Centrifuge) යන්ත්‍රයක්, ජෙනරේටරයක්, (Suction) යන්ත්‍රයක්, අපද්‍රව්‍ය බහාලුම්, KN 95 මුව ආවරණ, ශල්‍ය මුව  ආවරණ, මුව ආවරණ එලක, බූට්ස්, ඇඳ කවර සහ උණුසුම් කාරක ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ රැසක් පරිත්‍යාග කිරීමට කටයුතු කරන ලදී.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ **යුනිලිවර් ශ්‍රී ලංකාහි සැපයුම් දාම අධ්‍යක්ෂ ජෙරාඩ් ඉරුදයරාජ් මහතා** *''මීට වසර 60කට පමණ Ceytea කර්මාන්තශාලාවේ නිෂ්පාදන මෙහෙයුම් ආරම්භ කළ දා පටන් ප්‍රජා සංවර්ධන වැඩසටහන් හරහා නුවරඑළිය ප්‍රදේශයේ ජනතාව සමඟ ශක්තිමත් හා තිරසාර බැඳීමක් ගොඩනගා ගැනමට අපි සමත් වුණා. අද දවසේ රටක් ලෙස අප සියලු දෙනා වසංගතයට එරෙහිව සටනක යෙදී සිටින බැවින් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ඔවුන් වෙත ලබා දීම අපගේ යුතුකමක් බව අපි තරයේ විශ්වාස කරනවා''* යනුවෙන් පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ **යුනිලිවර් ශ්‍රී ලංකාහි Ceytea තේ කර්මාන්තශාලාවේ කළමනාකාරිණී අනූෂා කොතලාවල මහත්මිය** සඳහන් කර සිටියේ *''අපට ආධාර කිරීමේ අවස්ථාවක් උදා වූ විට අපට කළ හැකි ඕනෑම ආකාරයේ සහයෝගයක් ලබා දීමට අපි කටයුතු කළා. නුවරඑළිය කලාපයේ ජීවත් වන අපගේ සෙසු රට වැසියන් වෙත සහයෝගය ලබා දීමට හැකි වීම පිළිබඳ අපි සතුටට පත්වන අතර අප ලබා දුන් දායකත්වය තුළින් ප්‍රදේශයේ සෞඛ්‍ය සේවාවන්හි ගුණාත්මකබව තව දුරටත් ශක්තිමත් වනු ඇතැයි අපි බලාපොරොත්තු වනවා.''* යනුවෙනි.

මෙම පරිත්‍යාගයන් පිළිබඳව අදහස් දක්වමින් **නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ඩබ්. ආර්. එම්. මහේන්ද්‍ර සෙනෙවිරත්න මහතා** *''මෙම COVID-19 වසංගත තත්වය තුළ අපගේ රෝහල වෙනුවෙන් නොමසුරු ආධාර උපකාර ලබාදීම පිළිබඳව යුනිලිවර් ආයතනයට අපගේ හෘදයාංගම ස්තූතිය පුද කිරීමට කැමතියි. මේ කාලය තුළ පරිත්‍යාගය කරනු ලබන සියලු දේ අපට ඉතාමත් වැදගත් වන අතරම අපගේ රෝගීන්ට මෙන්ම ඉදිරි පෙළ සෞඛ්‍ය සේවකයන් වෙත උපරිම සේවාවක් ලබා දීම සඳහා ඒ සියලු පරිත්‍යාගයන් ඵලදායී ආකාරයෙන් භාවිත කිරීමට අපි කටයුතු කරනවා.''* යනුවෙන් පවසා සිටින ලදී.

**ආගරපතන ප්‍රාදේශීය රෝහලේ වෛද්‍ය නිළධාරී වෛද්‍ය ටී.පී.ටී.ජේ. බණ්ඩාර මහතා** මෙහිදී සඳහන් කර සිටියේ *''අප සතු විදුලි ජනක යන්ත්‍රය ක්‍රියා විරහිත වී බොහෝ කල් පසු වුවත්, අප හට එයට විසඳුමක් නොවීය. දුෂ්කර ප්‍රදේශයක් වන මෙම ප්‍රදේශයේ විදුලිය විසන්ධි වීම වරින් වර සිදුවීම නිසා රෝගීන් මහත් අපහසුතාවයට පත් වූ අවස්ථා බහුලය. අපගේ අපහසුතාව ගැන මහත් උනන්දුවකින් යුතුව ඔබ කාර්ය මණ්ඩලය අප රෝහලට විශාල අඩුපාඩුවක්ව පැවති විදුලි ජනක යන්ත්‍රයක් ලබා දීම ගැන අප සතුටු වන්නෙමු.''* යනුවෙනි.

**ලිඳුල ප්‍රාදේශීය රෝහලේ දිස්ත්‍රික් වෛද්‍ය නිළධාරී වෛද්‍ය සඳුන් ජයලත් මහතා** යුනිලිවර් සමාගමට සිය ස්තූතිය පළ කරමින් සඳහන් කර සිටියේ *''මේ දිනවල රටේ උද්ගතව පවතින ව්‍යසනකාරී තත්වය හමුවේ ඔබ ආයතනය විසින් ලිඳුල රෝහලට අත්‍යාවශ්‍යව තිබූ ශල්‍ය උපකරණ සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක්*

*පරිත්‍යාග කළ අතර, ඒ පිළිබඳව රෝහල් කාර්ය මණ්ඩලයේ මෙන්ම මාගේ හෘදයාංගම ස්තූතිය මෙයින් පුදකර සිටිමු.'' යනුවෙනි.*

**ලිඳුල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේ වෛද්‍ය නිළධාරී වෛද්‍ය ජනත් අබේගුණරත්න මහතා** මෙහිදී අදහස් දක්වමින් *''ශ්‍රී ලංකාවේ පවතින COVID-19 වසංගත තත්වය හේතුවෙන් අප සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයෙහි නිරතුරුව PCR සාම්පල් ලබා ගන්නා අතර ඒ සඳහා අප ආයතනයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරීන් සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට අවශ්‍ය ද්‍රව්‍ය අප සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය මගින් සිදු කරන ලද ඉල්ලීමට අනුව ඔබ ආයතනය මගින් ලබා දීමට කටයුතු කළ අතර ඒ සම්බන්ධයෙන් අපගේ ස්තූතිය පුද කර සිටිමි. එමෙන්ම අප සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයට අත්‍යාවශ්‍ය අවස්ථාවලදී ඔබ ආයතනයෙන් ලබා දෙන සහයෝගය ඉතා අගය කොට සලකන අතර මින් ඉදිරියට ඔබගේ සහයෝගය අපේක්ෂා කරන්නෙමු.''* යනුවෙන් පැවසීය.

2020 මාර්තු මස සිට මේ දක්වා COVID-19 සහන සේවා සඳහා රුපියල් මිලියන 70කට වැඩි වටිනාකමකින් යුත් දායකත්වයක් සිදු කර ඇති යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම තමන්ගේ වෙළෙඳ නාම කිහිපයක් සමඟ එක්ව මහජන දැනුවත් භාවය හා ආරක්ෂාව සහතික කිරීම වෙනුවෙන්ද පියවර ගෙන ඇත. පසුගියදා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත රුපියල් මිලියන 10ක් වටිනා ඔක්සිජන් සාන්ද්‍රක යන්ත්‍ර 32ක් පරිත්‍යාග කළ යුනිලිවර් සමාගම තමන්ගේ සනීපාරක්ෂණ සන්නාමය වන ලයිෆ්බෝයි සමඟ එක්ව දිවයින පුරා අත් සේදුම් මධ්‍යස්ථාන 100ක් පිහිටුවීමටද කටයුතු කළ අතර ප්‍රජා සාමාජිකයින් සමඟ එක්ව සනීපාරක්ෂාව හා සෞඛ්‍යාරක්ෂාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමටද නිරන්තරයෙන් කටයුතු කරනු ලබයි. එසේම COVID-19 සමාජ ආරක්ෂණ අරමුදල වෙනුවෙන්ද සිය දායකත්වය ලබා දුන් යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම ඊට අමතරව වසංගත තත්වය පාලනය හා වැළැක්වීම සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය හා සම්බන්ධිත ආයතනය වලට අවශ්‍ය පුද්ගලික ආරක්ෂණ උපකරණ, ශ්වසන ආධාරක උපකරණ, මුව ආවර්ණ සහ අත්‍යාවශ්‍ය යුනිලිවර් නිෂ්පාදන ලබා දීමටද කටයුතු කරන ලදී.